# ටැම්පිටිය ගම්මානය පිළිබඳ ව මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනය

ආර්.ඒ.බී.ඩී රණසිංහ*

තිස් වසරක යුද්ධයකට මුහුණ දුන් ප්‍රදේශයක පිහිටි සාම්ප්‍රදායික ගමක් ලෙස ටැම්පිටිය හඳුනාගත හැකිය.තිස් වසරක යුද්ධයේ අඳුරු සෙවනැලි පහව යමින් තරගකාරි ආර්ථික රටාවට පිවිසීමට අත්පොත් තැබූ ටැම්පිටිය ගම්මානයේ ඉතිහාසය ඓතිහාසික යුගය දක්වා දිවයයි.කාවන්තිස්ස රජතුමා දිසාමඬුල්ල පාලනය කිරීම සඳහා සද්ධාතිස්ස යොදවා තිබූ බව මහාවංශයේ සඳහන් වන අතර එළාර විරුද්ධ සටනට අවශ්‍ය ධාන්‍ය හා සේනා සංවිධානය කිරීම සිදුකල ප්‍රදේශයක් ලෙස මෙම ප්‍රදේශය හඳුනාගත හැකිය. 1818 කැරැල්ල පරාජය වු පසු බ්‍රිතාන්‍ය මර්දනයට බියෙන් පැන ආ පිරිසකගෙන් ජනාවාස වූ“කැලෑ ගමක්”ලෙස ටැම්පිටිය ගම්මානයේ ඉතිහාසය සංක්ෂිප්තව හඳුනාගත හැකිය.අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පුරාණ ටැම්පිටිය ගම්මානය අම්පාර හා මඩකලපුව දිස්ත්‍රික් සීමාව ආසන්නයේ පිහිටා ඇත.මෙම මානවවංශ අධ්‍යනය ඔස්සේ ටැම්පිටිය ගම කේන්ද්‍ර කරගෙන ගමේ මූලික අංග එනම් කුඹුර,ගෙවත්ත,කැලෑබිම් සහිත හේන,වැව,නිවාස,විහාරය හා දේවාලය පිළිබඳ අධ්‍යයනය කිරීම මූලික අභිප්‍රාය වේ.ඉතිහාසඥයින්ගේ සහ පුරාවිද්‍යාඥයින්ගේ ඇස නොගැටුන ටැම්පිටිය පුරාණ ගම පිළිබඳව තොරතුරු ලබා ගතහැකි සාහිත්‍යමය මූලාශ්‍ර ඉතාමත් විරලය.එම නිසා මෙම මානවවංශ විද්‍යාත්මක ගවේෂණය සාර්ථක කර ගැනීම සඳහා ගවේෂණ ක්‍රමවේද වශයෙන් ක්ෂේත්‍ර ගතව ක්ෂේත්‍රය පිළිබඳව ගවේෂණය කිරීම හා සම්මුඛ සාකච්ඡා ඔස්සේ දත්ත සපයා ගැනීම සිඳු කල අතර ටැම්පිටිය පුරාණ රජමහා විහාරයේ ඇති නටඹුන් පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරීම හා ඡායාරූප ලබා ගැනීම මූලිකව සිදුකරන ලදි.

ප්‍රමුඛ පදඃ සාම්ප්‍රදායික ගම, ටැම්පිටිය, මානවවංශ විද්‍යාව

* පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය buddhikadhananjaya91@gmail.com